මගේ අංකය / எனது இல / My No : DDD/HO/7/SD/06/ID/සිසු දිරිය

ඔබේ අංකය / உமது இல / Your No : ..................

දිනය / திகதி / Date : 2015.07.23

**චක්‍ර ලේඛ අංක :- 2015/ 10**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් වෙත,

<u>ජාත්‍යන්තර සාක්ෂරතා දින වැඩසටහන හා සිසු දිරිය ශිෂ්‍යත්ව වැඩසටහන. – **2015 සැප්තැම්බර් 08.**</u>

සෑම වසරකම සැප්තැම්බර් 08 වන දිනට යෙදෙන ජාත්‍යන්තර සාක්ෂරතා දිනයට සමගාමීව සිසු දිරිය ශිෂ්‍යත්ව වැඩසටහන මෙවරද ඉතා ඵලදායි අන්දමින් ක්‍රියාත්මක කිරීමට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු සූදානම් කර ඇත. පසුගිය වසර කිහිපය තුළ සක්‍රීයව ක්‍රියාත්මක නොවූ මෙම වැඩසටහන, 2015 වසරේ සිට ඉලක්කගත වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමට අරමුණු කර තිබේ.

02. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ සාක්ෂරතා මට්ටම ලෝකයේ වෙනත් රටවල් හා සැසඳීමේදී ඉදිරියෙන් සිටියද සැලකිය යුතු දරු පිරිසක් විවිධ වූ දුෂ්කරතා හේතුවෙන් එම සාක්ෂරතා මට්ටම නොලබා අසරණ තත්වයට පත්ව ඇත. එබැවින් දිළිදුකම පිටුදැකීමේ අරමුණින් ස්ථාපිත ආයතනයක් ලෙස දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මේ සඳහා වැඩි දායකත්වය ලබාදීම සුදුසු වේ.

03. ඉහත කී දරුවන්ගෙන් බහුතරය වතුකරයේත්, නාගරික පැල්පත් ප්‍රදේශවලත් වෙසෙන අඩු ආදායම්ලාභීන් බව වාර්තා වේ. සැබැවින්ම මෙම සාක්ෂරතා නොහැකියාව රටක දිළිදුකම බව කෙරෙහිද සෘජු ලෙස බලපෑම් ඇති කරෙන සාධකයකි. දරුවන්ට අධ්‍යාපනය ලැබීම, ළමා අයිතිවාසිකමක් වනවා සේම, ඔවුන් වෙත අධ්‍යාපනය ලබාදීම වැඩිහිටියන්ගේ වගකීමක් ද වේ. එහෙයින්, මෙතෙක් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී නිලධාරීන් ලැබූ අත්දැකීම් මත ඉදිරි කටයුතු සිදු කිරීම වඩාත් ඵලාදායී වනු ඇත.

04 ඒ අනුව මෙවරද, සාක්ෂරතා දින වැඩසටහන යෙදෙන සැප්තැම්බර් 08 වනදා සිට (2015.09.08) පුරා සතියක් තුළ මීට අදාළ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි. මෙම වැඩසටහන කඩිනමින් යුහුසුළුව සිදු කිරීමට දිරි ගන්වන මෙන් දන්වා සිටිමි. අප සැවොම එක්ව ගන්නා වූ මෙම උත්සාහයෙහි අස්වැන්න නෙළීම උදෙසා දරුවන් අඛණ්ඩව පාසැල් වෙත යොමු වන්නේද යන්න පසු විපරම් ද සිදු කිරීමට වග බලා ගත යුතු වේ. මෙම වැඩසටහනට දායකවීම යනු, රාජකාරි ජීවිතයේ ලබන ඉහළම තෘප්තියක්ද වනු නොඅනුමානය.

05. එහිදී පහත සඳහන් ක්‍රියාවලිය සහ ඔබගේ නිර්මාණශීලි දායකත්වයද උපයෝගී කර ගනිමින් මෙම වැඩසටහන සාර්ථක කර ගත හැකි වේ යැයි අපේක්ෂා කරමි.

(I) සාක්ෂරතා ගැටළු පිළිබඳ දිවිනැගුම කළමණාකරුවන් සහ සමාජ සංවර්ධන සහකාරවරුන් / දිවිනැගුම සංවර්ධන නිලධාරීන් මගින් ගම්මාන සමිති සභාපතිවරුන් සහ ළමා සමාජ සාමාජිකයින් දැනුවත් කිරිම හා ඔවුන්ගේ සක්‍රීය දායකත්වය වැඩසටහනට ලබා ගැනීම.

(ii)
i. පාසැල් යන, එහෙත් දරිද්‍රතාවය මත ඉතා අපහසුවෙන් තම අවශ්‍යතා සපුරා ගනිමින් පාසැල් යන දරුවන් හඳුනා ගැනීම.

ii. එම දරුවන් සඳහා සිසු දිරිය ශිෂ්‍යත්ව ලබාදීම.

iii.. අවුරුදු 5 – 14 ත් අතර වයස් කාණ්ඩවලට අයත් පාසැල් නොයන දරුවන් හඳුනා ගැනීම.

iv. හඳුනා ගත් එම දරුවන් පාසැල්වලට ඇතුළත් කිරීම.

iv. පාසැල් ගත කළ නොහැකි දරුවන් වේ නම්, ඔවුන් සඳහා ප්‍රාදේශීය නොවිධිමත් අධ්‍යාපන ඒකකය සමග ඒකාබද්ධවී වැඩසටහන් සකස් කිරීම.

(iii). මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, කලාපීය නොවිධිමත් අධ්‍යාපන කාර්යාලය ඇතුළු, වැදගත් වේ යැයි අදහස් කරන අනිකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලද සහාය ලබා ගැනීම.

(iv) පාසැල්වලට භාර දෙන දරු දැරියන්ගේ පොත් පත්, පාසැල් නිල ඇඳුම්, පාවහන් ආදී අවශ්‍යතා හඳුනා ගෙන, ප්‍රදේශයේ ප්‍රභූවරුන්ගේ හා සමාජ සංවර්ධන පදනමේ අරමුදල් යොදා ගනිමින් එම අවශ්‍යතා හැකිතාක් සපුරාලීම.

(v). ඉහත දරුවන් සඳහා කැපකරු මාපිය දායක ක්‍රමය යටතේ හා සමාජ සංවර්ධන පදනම උපයෝගී කොට ගෙන සිසු දිරිය ශිෂ්‍යත්ව ක්‍රමයක් ක්‍රියාවට නැංවීම.

(අ) **පසුගිය වසරවලදී ලැබූ අත්දැකීම වනුයේ මෙදින මුල් කර ගෙන විශාල පිරිසක් පාසැල්වලට ඇතුළත් කලද, ඔවුන් අතරමගදී නැවතත් පාසැල් නොයන ප්‍රවාහයට එක්වීමයි. එයට විවිධ හේතු මූලික වී තිබුණද, ආර්ථික නොහැකියාව මූලිකම ගැටළුවකි. එබැවින් මෙවර අවම වශයෙන් එක් වසමක් තුළ මෙවැනි එක් දරුවෙකුට හෝ ශිෂ්‍යත්ව අවස්ථාවක් ළගා කරදීමට අපේක්ෂා කෙරේ. මාසිකව රු. 500/- බැගින් වසරකට රුපියල් 6,000/- ක් වන ශිෂ්‍යත්වයක්, හඳුනා ගන්නා එක් දරුවෙකුට ලබාදීමට අපේක්ෂා කළ යුතුය. කැපකරු මාපිය දායක ක්‍රමය තුළින් කැපකරුවන් හඳුන්වාදීම ද තවත් අරමුණකි.**

(ආ) ඊට අමතරව සමාජ සංවර්ධන පදනම හරහා එම වටිනාකමින් යුත් ශිෂ්‍යත්ව හැකිතාක් ප්‍රමාණයක් ලබාදීමට සැලසුම් කළයුතු වේ.

(vi) දිළිඳුකමේ හේතුවෙන් පාසැල් නොයන දරුවන්ගේ පවුල් සවිබලකරණය සඳහා විවිධාකාරවූ පියවර ගැනීම උචිතය.

මෙබඳු පවුල්වල පවතින දුෂ්කරතා හා ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳව අදාළ වසමේ සංවර්ධන නිලධාරින් හරහා තොරතුරු ඒකරාශී කර ගැනීමටත් දිවිනැගුම බැංකු ණය ලබාදීම හා වෙනත් ව්‍යාපෘති ඇරඹීමේදී මෙම පවුල් පිළිබඳව විශේෂ අවධානයකින් යුතුව කටයුතු කිරීමටත් ඊට සහාය දීමටත් විශේෂ වැඩ පිළිවෙලක් යොදන ලෙස ඉල්ලා සිටිමි. තවද එම තොරතුරු අප වෙත වාර්තා කිරීමටද ප්‍රගතිය පිරික්සීමටද වැඩ පිළිවෙලක් යෙදීම මැනවි.

06. 2015 සැප්තැම්බර් 08 සාක්ෂරතා දිනය මුල් කර ගනිමින්,

I. වැඩිම සිසුන් පිරිසක් පාසැලට ඇතුලත් කිරීමට වැඩ පිළිවෙලක් සකස් කරන්න.

II. වැඩිම සිසුන් ප්‍රමාණයකට ශිෂ්‍යත්ව සපයා දෙන්න.

III. වැඩිම සිසුන් සංඛ්‍යාවකට කැපකරු මාපිය ක්‍රමය හඳුන්වා දෙන්න.

ඉහත i, ii හා iii කාර්යයන්ට උපරිම දායකත්වයක් ලබාදෙන නිලධාරීන් තිදෙනා දිස්ත්‍රික් මට්ටමින් ඇගයීමට ලක් කරනු ලැබේ.

මීට අමතරව ජාතික ඇගයීම් අවස්ථාවේදී මේ සඳහා ඉහල දායකත්වයක් ලබා දෙන නිලධාරීන් සඳහා හැකි ප්‍රතිලාභ ලබාදීමටද අපේක්ෂිතය.

07. මෙම වැඩසටහනට අදාළව, දිවිනැගුම නිලධාරින්, අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ නිලධාරීන්ද ඒ සඳහා වැදගත් වේ යැයි අදහස් කරන අනිකුත් අයද කැඳවා විශේෂ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු කරන මෙන් ඉල්ලමි. එකී සාකච්ඡාව සඳහා සමාජ සංවර්ධන පදනම් වෙතින් රු. 10,000/- ක මුදලක් වැය කළ හැකි බවද දැනුම් දෙමි.

08. මේ පිළිබඳව මාසික ප්‍රගතිය ඇමුණුම් අංක 01 භාවිතා කොට ඒ ඒ දිස්ත්‍රික්කයන්හි ප්‍රගති වාර්තා සෑම මසකම 10 වන දිනට පෙර මා වෙත එවිය යුතුය.

09. **සාක්ෂරතා නොහැකියාවෙන් පෙළෙන දරුවන් මුදවා ගැනීමට දක්වන දායකත්වය, දිළිඳුකම පිටුදැකීමෙහිලා ප්‍රබල සාධයක් වන බැවින්, මෙහිලා ඔබ දක්වන සහාය ඉතා අගයකොට සලකන බවත් සැබැවින්ම මෙය පුණ්‍ය කටයුත්තක්ද වන බවත් කාරුණිකව සඳහන් කරමි.**

ධම්මික ගුණවර්ධන,

අධ්‍යක්ෂ ජනරාල්. (වැ.බ.)

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 1. | ලේකම්, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය. | - | දැ.ගැ.ස. හා අ. ක. ස. |
| 2. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය | - | දැ.ගැ.ස. හා අ. ක. ස. |
| 3. | අතිරේක ලේකම්, (දිවිනැගුම) | - | දැ.ගැ.ස. හා අ. ක. ස. |
| 4. | ප්‍රාදේශීය ලේකම්, ......................... | - | දැ.ගැ.ස. හා අ.ක.ස. |
| 5. | සභාපති, ළමා ආරක්ෂක අධිකාරිය. | - | දැ.ගැ.ස. |
| 6. | සියළුම අංශ ප්‍රධානීන්. | | |